ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

කළමනාකරණ අධ්‍යයන පීඨය

කළමනාකරණ අධ්‍යයනවේදී ගෞරව උපාධිය

**AFU4571 - පිරිවැය හා කළමනාකරණ ගිණුම්කරණය**

අවසන් පරීක්ෂණය - **2025/2026**

කාලය : පැය තුන **(03)** යි

දිනය: **2026.07.04** | මුළු ලකුණු: **100** | වේලාව: ප.ව. **01.30** - ප.ව. **04.30**

උපදෙස් :

- මුළු ප්‍රශ්න ගණන පහ **(05)** කි.
- ප්‍රශ්න හතරකට **(04)** පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයක් අවසානයේම එයට අදාල ලකුණු සඳහන් කොට තිබේ.
- සියළුම පෙරවැඩ පැහැදිලිව පෙන්වන්න.
- සෑම පිළිතුරක්ම අළුත් පිටුවකින් ආරම්භ කරන්න.
- වැඩසටහන් සම්පාදනය කල නොහැකි ගණක යන්ත්‍ර භාවිතා කළ හැක.
- පිටු ගණන හය **(06)** කි.

**ප්‍රශ්න අංක 01**

(අ) නුවන් එන්ටර්ප්‍රයිස් විසින් එහි නිෂ්පාදන ක්‍රියාවලියේදී භාවිතා කරන "Z" නම් තොග අයිතමයක් පිළිබඳ විස්තර පහත පරිදි ඔබ වෙත සපයා ඇත.

මාසික පරිභෝජනය - උපරිමය ඒකක 2,000 සහ අවමය ඒකක 400

පොරොත්තු කාලය - උපරිමය මාස 12 සහ අවමය මාස 3

වරකට ඇණවුම් කරනු ලබන ප්‍රමාණය - ඒකක 5,000 කි.

අවශ්‍ය වන්නේ,

**"Z"** නම් තොග අයිතමයට අදාළව පහත දැක්වෙන තොග මට්ටම් ගණනය කරන්න.

i. නැවත ඇණවුම් කිරීමේ මට්ටම

ii. උපරිම තොග මට්ටම

iii. අවම තොග මට්ටම

iv. සාමාන්‍ය තොග මට්ටම

**(2.5 x 4 = ලකුණු 10)**

(ආ) සුවඳ විලවුන් නිෂ්පාදනය කරන බ්ලූබෙරි පෞද්ගලික සමාගමෙහි සුඛෝපභෝගී සුවඳ විලවුන් නිෂ්පාදනයකට අදාළව උපුටා ගත් තොරතුරු පහත දැක්වේ.

වාර්ෂික ඉල්ලුම ඒකක 70,000 කි. ඒකකයක් ඇණවුම් කිරීමේ පිරිවැය රු. 70/- ක් වන අතර ගබඩා කිරීමේ සහ රඳවා ගැනීමේ පිරිවැය - ඒකක පිරිවැයෙන් 20% කි. ඒකකයක පිරිවැය රු. 100/- කි.

**අවශ්‍ය වන්නේ ඉහත කරුණු මත පදනම්ව පහත දෑ ගණනය කරන්න,**

**i.** **ආර්ථික ඇණවුම් ප්‍රමාණය.**

**ii.** **ප්‍රශස්ත වාර්ෂික ඇණවුම් සංඛ්‍යාව.**

**(2.5 x 2 = ලකුණු 05)**

(ඇ) Moonleaf (Pvt) Ltd යනු ස්වභාවික රූපලාවන්‍ය හා සුවතා නිෂ්පාදන නිෂ්පාදනය කරන කුඩා පරිමාණ සමාගමකි. මෑතකදී එම සමාගම විසින් විවේකය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා නිර්මාණය කරන ලද අත්කම් නිර්මාණිත ඉටිපන්දමක් වන "Moonleaf ලැවෙන්ඩර් සුවඳැති ඉටිපන්දම්" හඳුන්වා දෙන ලදී. පහත සඳහන් පිරිවැය තොරතුරු එම නිෂ්පාදනයෙහි 2026 ජූලි මාසය සඳහා අදාළ වේ.

| පිරිවැය විස්තරය | වටිනාකම (රු.) |
|---|---|
| ආරම්භක තොගය (2026.07.01) | 300,000 |
| මිලදී ගත් අමුද්‍රව්‍ය (ඖෂධ පැළෑටි සහ ඇසුරුම්) | 1,500,000 |
| නිෂ්පාදන පහසුකම් කුලී | 50,000 |
| සුගන්ධ තෙල් සහ සුවඳ විලවුන් | 475,000 |
| සේවක වැටුප් | 400,000 |
| විදුලිය | 25,000 |
| සුපරීක්ෂක ගාස්තු | 250,000 |
| යන්ත්‍ර නඩත්තු වියදම් | 35,000 |
| විවිධ වියදම් | 12,000 |
| යන්ත්‍ර ක්ෂයවීම් (මෙම ඇණවුම සඳහා) | 15,000 |
| අවසන් තොගය (2026.07.31) | 155,000 |

සමාගම මුළු නිෂ්පාදන පිරිවැයෙන් 20% ක ලාභාන්තිකයක් පවත්වා ගන්නා අතර ජූලි මාසයේදී Moonleaf ලැවෙන්ඩර් සුවඳැති ඉටිපන්දම් ඒකක 2,500 ක් නිෂ්පාදනය කර ඇත.

අවශ්‍ය වන්නේ,

i. Moonleaf ලැවෙන්ඩර් සුවඳැති ඉටිපන්දම් නිෂ්පාදනයෙහි මුළු පිරිවැය සහ ඒකක පිරිවැය ගණනය කරන්න. (ලකුණු 10)

ii. ඒකකයක විකුණුම් මිල ගණනය කරන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 25)

ප්‍රශ්න අංක 02

(අ) එක්තරා බේකරි නිෂ්පාදකයෙකු නව බිස්කට් වර්ගයක් නිෂ්පාදනය කරන අතර එක් බිස්කට් පැකට්ටුවක් රු. 1,000/- බැගින් අලෙවි කරයි. එහි නිෂ්පාදන පිරිවැය පහත පරිදි වේ.

| පිරිවැය | වටිනාකම (රු.) |
|---|---|
| ඒකකයකට සෘජු ද්‍රව්‍ය | 250/- |
| ඒකකයකට සෘජු ශ්‍රමය | 200/- |
| ඒකකයකට වෙනත් සෘජු පිරිවැය | 75/- |
| මාසික ස්ථාවර පිරිවැය | 5,600,000/- |
| පුරෝකථනය කරන ලද මාසික විකුණුම් | ඒකක 40,000 |

අවශ්‍ය වන්නේ,

i. ඒකක දායකත්වය ගණනය කරන්න. (ලකුණු 02)

ii. විකුණුම් දායකත්ව අනුපාතය (contribution to sales ratio) ගණනය කරන්න. (ලකුණු 03)

iii. ලාභ සමච්ඡේද ඒකක ගණන සහ වටිනාකම ගණනය කරන්න. (ලකුණු 04)

iv. ආරක්ෂිත ආන්තිකය ඒකක වලින් ගණනය කරන්න. (ලකුණු 03)

v. ඒකකයක විකුණුම් මිල රු. 115/- කින් වැඩි වුවහොත්, නව ලාභ සමච්ඡේද ඒකක ගණන කොපමණද? (ලකුණු 03)

(ආ) 2026 ජූලි මාසය සඳහා වූ පහත සඳහන් පිරිවැය තොරතුරු BrewCraft Coffee (Pvt) Ltd හි කර්මාන්තශාලාවට අදාළ වේ. එය නිෂ්පාදන පිරිවැය මධ්‍යස්ථාන තුනක් සහ සේවා පිරිවැය මධ්‍යස්ථාන දෙකකින් සමන්විත වේ.

- ගොඩනැගිලි කුලී වියදම් රු. 120,000.
- වරිපනම් රු. 15,000
- විදුලිය - විදුලි පහන් සඳහා රු. 20,000 සහ යන්ත්‍ර සඳහා රු. 60,000.
- යන්ත්‍ර ක්ෂය රු. 60,000
- යන්ත්‍ර රක්ෂණය රු. 12,000

- අධීක්ෂණ වියදම රු. 40,000
- ආපනශාලා වියදම රු. 24,000

| විස්තරය | එකතුව | නිෂ්පාදන පිරිවැය මධ්‍යස්ථාන | | | සේවා පිරිවැය මධ්‍යස්ථාන | |
|---|---|---|---|---|---|---|
| | | A | B | C | ගබඩා | නඩත්තු |
| භූමි ප්‍රමාණය (වර්ග අඩි) | 3,000 | 900 | 700 | 600 | 400 | 400 |
| යන්ත්‍ර වටිනාකම (රු.) | 600,000 | 200,000 | 150,000 | 150,000 | 40,000 | 60,000 |
| සේවකයින් ගණන | 24 | 6 | 8 | 4 | 4 | 2 |
| යන්ත්‍ර ධාරිතාව (අශ්ව බල) | 90 | 25 | 23 | 20 | 10 | 12 |

**අවශ්‍ය වන්නේ,**

**ඉහත තොරතුරු මත පදනම්ව පොදුකාර්යය විභජන පත්‍රිකාව සකස් කරන්න.** **(ලකුණු 10)**

**(මුළු ලකුණු 25)**

ප්‍රශ්න අංක **03**

(අ) BrightWave Solutions නම් ඩිජිටල් අලෙවිකරණ ආයතනයකට සේවාලාභියෙකු විසින් හදිසි ප්‍රචාරක කටයුත්තක් කරන ලෙස ඉල්ලීමක් ලැබී ඇති අතර, ඒ සඳහා පහත සම්පත් අවශ්‍ය වේ.

- වර්තමානයේ පැයකට රු. 3,000/- ක අනුපාතයකින් වැටුප් ලබන සේවයේ නියුතු කාර්ය මණ්ඩල සාමාජිකයෙකු පැය 30 ක් මෙම කාර්යය සඳහා වෙන් කළ යුතුය. වෙනත් කිසිදු කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට දැනට කරගෙන යන වැඩ ආවරණය කිරීමට නොහැකි බැවින්, සමාගමට පැයකට රු. 800/- ක දායකත්වයක් (contribution) අහිමි වේ. රැකියාවේ හදිසිභාවය නිසා, කාර්ය මණ්ඩල සාමාජිකයාට පැයකට රු. 2,500 ක අනුපාතයකින් වැටුප් ගෙවීමට සිදු වේ.
- මෙම කාර්යය සඳහා සමාගමෙහි ඉහළ කාර්යසාධනයක් සහිත චිත්‍රක විදැහුම් සේවාදායකයෙහි (high-performance graphic rendering server time) කාලය පැය 7ක් අවශ්‍ය වන අතර, එය සාමාන්‍යයෙන් සමාගම බාහිර පරිශීලකයින්ට පැයකට රු. 1,000/- ක අනුපාතයකට කුලියට දෙයි. මෙම ප්‍රධාන පරිගණකය දැනට දිනකට පැය 24 පුරාම, සතියේ දින 7 ම භාවිතා වේ.

**අවශ්‍ය වන්නේ හදිසි කාර්යයට අදාළ පිරිවැය (relevant cost) තීරණය කරන්න.**

**(ලකුණු 10)**

(ආ) ActivePro Industries PLC යනු ක්‍රීඩා උපකරණ නිෂ්පාදනය කිරීමේ නිරත සමාගමකි. එම සමාගමට රු. 2,800,000 ක වටිනාකමකින් යුත් විශේෂ පුහුණු කට්ටල ඇණවුමක් ලැබී ඇත. ඇණවුම සම්පූර්ණ කිරීම සඳහා පහත සඳහන් සම්පත් අවශ්‍ය වේ.

- රු. 850,000 ක් වටිනා අමුද්‍රව්‍ය (රෙදි, ආරක්ෂිත ආවරණ, උපාංග සහ ඇසුරුම් ද්‍රව්‍ය) අවශ්‍ය වේ.
- වර්තමානයේ සමාගම සතු ශ්‍රමය සමාගමේ නිත්‍ය මෙහෙයුම් ක්‍රියාකාරකම් වල සම්පූර්ණයෙන්ම

යෙදී සිටින අතර, එය දැනට රු. 800 ක දායකත්වයක් (contribution) පැයකට උපයයි. මෙම විශේෂ ඇණවුම සඳහා ශ්‍රම පැය 600 ක් අවශ්‍ය වේ. මෙම විශේෂ ඇණවුම පිළිගන්නේ නම්, නිත්‍ය මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ශ්‍රම කාලය මෙම විශේෂ ඇණවුම සම්පූර්ණ කිරීම සඳහා යොමු කළ යුතුය. වර්තමානයේ සේවකයින්ට පැයකට රු. 550 ක වැටුපක් ගෙවනු ලැබේ.

- විචල්‍ය පොදු කාර්ය පිරිවැය පැයකට රු. 400 බැගින් අය කෙරේ.
- ස්ථාවර පොදු කාර්ය පැයකට රු. 450 බැගින් අවශෝෂණය කරයි. කෙසේ වෙතත්, මෙම විශේෂ ඇණවුමෙහි ප්‍රතිඵලයක් ලෙස සාමාන්‍ය පොදු කාර්ය පිරිවැය රු. 300,000 කින් වැඩි වනු ඇත.

**අවශ්‍ය වන්නේ,**

**මෙම විශේෂ ඇණවුම පිළිගත යුතුද නැද්ද යන්න තීරණය කරන්න** **(ලකුණු 15)**

**(මුළු ලකුණු 25)**

**ප්‍රශ්න අංක 04**

(අ) MilkyWay Dairies PLC නම් සමාගම එකම ක්‍රියාවලියක් හරහා 'ක්‍රීම්' සහ 'යොදය ඉවත් කළ කිරි' යන ඒකාබද්ධ නිෂ්පාදන දෙකක් නිෂ්පාදනය කරයි. රු. 320,000 ක ඒකාබද්ධ සැකසුම් පිරිවැයක් බෙදුම් ලක්ෂ්‍යය දක්වා දැරීමට සිදුවන අතර, බෙදුම් ලක්ෂ්‍යයේදී ක්‍රීම් ඒකක 140,000 ක් සහ යොදය ඉවත් කළ කිරි ඒකක 90,000 ක් නිෂ්පාදනය කෙරේ. බෙදුම් ලක්ෂ්‍යයේදී විකුණුම් මිල ගණන් වනුයේ ක්‍රීම් ඒකකයකට රු. 3.00 ක් සහ යොදය ඉවත් කළ කිරි ඒකකයකට රු. 2.50 කි. ක්‍රීම් ඒකක තවදුරටත් සකස් කිරීමෙන් නව නිෂ්පාදනයක් වන 'තත්ත්වයෙන් උසස් බටර්' ඒකක 55,000ක් නිෂ්පාදනය කළ හැකි නමුත්, ඒ සඳහා රු. 45,000 ක අමතර ස්ථාවර පිරිවැයක් සහ රු. 0.40 ක ඒකක විචල්‍ය පිරිවැයක් දැරීමට සිදුවේ. 'තත්ත්වයෙන් උසස් බටර්' ඒකකයක විකුණුම් මිල රු. 9.00 කි.

**අවශ්‍ය වන්නේ, සමාගම නිෂ්පාදනය කර අලෙවි කළ යුතු වන්නේ ක්‍රීම් ද? නොමැති නම් 'තත්ත්වයෙන් උසස් බටර්' ද යන්න තීරණය කරන්න.** **(ලකුණු 10)**

(ආ) CeyWood Furnishings PLC නම් වූ සමාගමෙහි 2026 අප්‍රේල්, මැයි, ජූනි සහ ජූලි මාස සඳහා සිය මෙහෙයුම් ක්‍රියාකාරකම්වල පුරෝකථනයන් පහත දක්වා ඇත.

| | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි |
|---|---|---|---|---|
| අත්පිට විකුණුම් (රු.) | 40,500 | 30,200 | 38,000 | 48,800 |
| ණයට විකුණුම් (රු.) | 50,000 | 53,500 | 77,200 | 82,900 |

i. ණය මත විකුණන ලද භාණ්ඩ සඳහා මුදල් ලැබීම් විකුණනු ලැබූ මාසයේ එහි වටිනාකමින් 40% ක් සහ ඊළඟ මාසයේ 60% ක් වනු ඇතැයි පුරෝකථනය කර ඇත.

ii. සමස්ත විකුණුම් වටිනාකමින් සාමාන්‍යයෙන් 50% ක් තොග මිලදී ගැනීම් ලෙස ඇස්තමේන්තු කොට ඇත. මෙම මිලදී ගැනීම් වලින් 60% ක් සඳහා මිලදී ගත් මාසයේ ගෙවනු ලබන අතර ඉතිරිය ඊළඟ

මාසයේ දී ගෙවනු ලැබේ.

iii. මෙහෙයුම් වියදම් තුළ රු. 12,500 ක කාර්යයාල කුලිය ද, රු. 15,000 ක වැටුප් ද, රු. 5,000 ක උපයෝගිතා වියදම් ද අන්තර්ගත වන අතර ඒවා දරනු ලබන මාසයේදීම ගෙවනු ලබයි.

iv. 2026 මැයි මස ආරම්භයේ දී මුදල් ශේෂය රු. 8,000 කි.

අවශ්‍ය වන්නේ,

**2026 මැයි සහ ජුනි යන මාස සඳහා මුදල් අයවැය සකස් කරන්න.** **(ලකුණු 15)**

**(මුළු ලකුණු 25)**

ප්‍රශ්න අංක **05**

(අ) Velvet Scoop PLC විසින් වැනිලා, චොක්ලට් සහ ස්ට්‍රෝබෙරි යනුවෙන් අයිස්ක්‍රීම් වර්ග තුනක් නිෂ්පාදනය කරයි. වර්තමානයේ, වැනිලා සහ චොක්ලට් අයිස්ක්‍රීම් ලාභදායී වන අතර, පහත දැක්වෙන පරිදි ස්ට්‍රෝබෙරි අයිස්ක්‍රීම් පාඩු ලබයි. මෙවායින් ලැබෙන වර්තමාන වාර්ෂික ශුද්ධ ලාභය/අලාභය පහත පරිදි වේ.

| | වැනිලා (රු.) | ස්ට්‍රෝබෙරි (රු.) | චොක්ලට් (රු.) | මුළු වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| විකුණුම් | 70,000 | 50,000 | 80,000 | 200,000 |
| විචල්‍ය පිරිවැය | 20,000 | 45,000 | 30,000 | 95,000 |
| ස්ථාවර පිරිවැය | 20,000 | 15,000 | 25,000 | 60,000 |
| ලාභය/අලාභය | 30,000 | (10,000) | 25,000 | 45,000 |

මේ අනුව සමාගම මේ වන විට ස්ට්‍රෝබෙරි අයිස්ක්‍රීම් නිෂ්පාදනය දිගටම කරගෙන යා යුතුද නැද්ද යන්න සලකා බලමින් සිටී.

අවශ්‍ය වන්නේ,

**i.** **ස්ට්‍රෝබෙරි අයිස්ක්‍රීම් නිෂ්පාදනය නතර කළ යුතුද නැද්ද යන්න තීරණය කරන්න**

**(ලකුණු 15)**

**ii.** **කෙසේ වෙතත්, ස්ට්‍රෝබෙරි අයිස්ක්‍රීම් නිෂ්පාදනය නැවැත්වීමෙන් ජනිත වන සම්පත්, රුපියල් 60,000 කට අලෙවි වන සහ රුපියල් 30,000 ක විචල්‍ය පිරිවැයක් සහ රුපියල් 15,000 ක අමතර ස්ථාවර පිරිවැයක් දැරීමට සිදුවන ස්ට්‍රෝබෙරි Supreme නම් නව අයිස්ක්‍රීම් වර්ගයක් නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කළ හැකි යැයි සිතන්න. ඒ අනුව ස්ට්‍රෝබෙරි අයිස්ක්‍රීම් වෙනුවට ස්ට්‍රෝබෙරි Supreme අයිස්ක්‍රීම් නිෂ්පාදනය කළ යුතුද නැද්ද යන්න තීරණය කරන්න.**

**(ලකුණු 10)**

**(මුළු ලකුණු 25)**

**- සියලුම හිමිකම් ඇවිරිණි-**